මාධ්‍ය නිවේදන අංක 17

මැතිවරණ කොමිෂන් සභාව

## පාර්ලිමේන්තු මැතිවරණය - 2020.04.25

### දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙතින් කෙරෙන ඉල්ලීම
### COVID 19ට ඉඩ නොදෙමු

2020 මාර්තු මස 17, 18 සහ 19 යන දිනයන්හි නාමයෝජනා භාර දීමට පැමිණෙන අවස්ථාවේ දී , ඒ සඳහා නීතියෙන් බලයලත් පුද්ගලයන් පමණක් නාමයෝජනා ශාලාව තුළට එවන ලෙස නැතහොත් පැමිණෙන ලෙස, දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ගෙන්, බලයලත් නියෝජිතයන්ගෙන් හා ස්වාධීන කණ්ඩායම්වල නායකයන්ගෙන් මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටිනු ලැබේ.

නාමයෝජනා භාර දීම සඳහා බලය ඇති ලේකම්වරයා, බලයලත් නියෝජිතයා හෝ ස්වාධීන කණ්ඩායම් නායකයා සහ නාමයෝජනා පත්‍රයේ දෙවැනි නම සඳහන් තැනැත්තාට නාමයෝජනා ශාලාව තුළට පැමිණිය හැකි අතර, අවශ්‍ය නම් එක් සහායකයෙක් පමණක් ද නාමයෝජනා ශාලාව තුළට කැඳවාගෙන ආ හැකි බව වැඩිදුරටත් දන්වා සිටිමි. එසේ වුවද, එසේ පැමිණිය හැකි උපරිම සංඛ්‍යාව කැඳවාගෙන ඒමෙන් වැළකී නාමයෝජනා භාර දෙන තැනැත්තා හා තවත් එක් අයකු පමණක් නාමයෝජනා ශාලාවට පැමිණෙන්නේ නම් එය බෙහෙවින් අගය කොට සලකනු ලැබේ.

එමෙන්ම මැතිවරණ නීතිය යටතේ පෙළපාළි යෑම හා නීති විරෝධී රැස්වීම් පැවැත්වීම තහනම් බැවින් හා අප රටට තර්ජනයක් වී ඇති COVID 19 හෙවත් කොරෝනා වෛරසයෙන් ආරක්ෂා විය යුතු බැවින් නාමයෝජනා ශාලාව අවට ඔබගේ ආධාරකරුවන් රැස් කරවීමෙන්, කැඳවීමෙන් හා පෙළපාළි යෑමෙන් වළකින ලෙස ද ඉල්ලා සිටිමි.

මෙම දින කිහිපය තුළ පමණක් නොව හැකියාවක් ඇත්නම් අවම වශයෙන් තවත් දින 10ක් වත් යනතුරු ප්‍රසිද්ධ මහජන රැළි හා ජනතාව රැස්කරවන ප්‍රචාරක වැඩසටහන් පැවැත්වීමෙන් වළකින ලෙස සියළුම දේශපාලන පක්ෂවල නායකයන්ගෙන්, අපේක්ෂකයන්ගෙන් හා දේශපාලන ක්‍රියාකාරීන්ගෙන් ඉතා ඕනෑකමින් සහ කරුණාවෙන් මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටියි.

මහින්ද දේශප්‍රිය
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2020.03.15